# MANRECAP මාසික පුවත් නිවේදනය #14

| සැප්තැම්බර් 2006 සිට ඔක්තෝම්බර් 2006 | # 14 |
|---|---|

## 1 : මන්නාරම් ශාන්ති පුරම් ගම්මානයේ පාරවල් අලුත්වැඩියා කිරීම.



ශාන්ති පුරම් ගම්මානය ප්‍රජා පාලන ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු වලින් ලබාගත් අවබෝධය හා දක්‍ෂතාවන් තුලින් ගමේ අනෙකුත් සංවර්ධන වැඩ කටයුතු වලට මුලිකත්වය ලැබුණි. ගමේ පිහිටුවා ඇති සී. බී. ඕ සංවිධාන වලින් ගමේ ඇති අනෙකුත් සංවිධාන සමග සාකච්ජා කොට වැඩ කටයුතු සංවිධාන කරණු ලැබේ. වැසි සමය තුලදී මේ ප්‍රදේශයේ පාරවල් සහ ඇල මාර්ග ජලයෙන් යටවී යන හෙයින් මෙහි මාර්ග සහ ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම ඉතාම හදිසි අවශ්‍යතාවයක් වේ.

ග්‍රාම සංවර්ධන සමිතියේ මුලිකත්වය යටතේ මරුතෙඩෙයි ඇලෙන් කිලෝ මීටර් එකහමාරක් පමණ ප්‍රතිසංස්කරණය කරන ලදී. වැඩ කරන ශ්‍රමිකයනට කෑම පහසුකම් සැපයීමේ ප්‍රතිපත්තිය යටතේ මේ වැඩ කොටස නිම කරන ලදී. මේ ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු නිසා මෙහි පතිතන වන වැසි ජලය ක්‍රමානුකුලව බැස යෑමට හැකිය. මේ කාර්‍ය සදහා පවුල් අනුතුනක් සම්බන්ධ වු අතර එක පවුලකට මුලු දිගින් 93/1 යන පංගු ක්‍රමය යටතේ වැඩ බෙදා දෙන ලදී.

මේ මාරුතෝඩ්ඩෙයි ඇලෙන් ගොඩ දමන ලද පස් ප්‍රයෝජනයට ගෙන මිටර් 500 ක් පමණ අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කරන ලදී. මේ කාර්‍ය ප්‍රදේශයේ තරුණ ක්‍රීඩා සමාජය, ගමේ ප්‍රජාවගේ සහභාගීත්වය ඇතිව නිම කරන ලදී. මෙහි ග්‍රාම සංවර්ධන සමිතිය මේ කාර්‍යය සදහා රුපියල්. 10,000 ක මුදලක් පරිත්‍යාග කරනු ලැබීය.

## 2 : මන්නාරම් පුන්තුකමාම් ග්‍රාමයේ බදුන් කෘෂි ව්‍යාපෘතිය



පුත්තු කමාම් ප්‍රදේශයේ ගොවි ජනතාවට බදුන් කෘෂි කර්මාන්තය හදුන්වා දී ඇත. වම්බටු තක්කාලි බණ්ඩක්කා වැනි එළවළු වර්ග ප්ලාස්ටික් බග් වල වගා කර ඇත. මේ වගාවන් වල නියුතු ගොවීන් තමන්ගේ දෛනික අවශ්‍යතාවයනට අවශ්‍ය එළවලු මේ ආකාරයෙන් ලබා ගැනීම නිසා එළවලු මිලදී ගැනීමට වැයවන මුදල ඉතිරි කර ගැනීමට හැකිවී ඇත.

## 3 : මන්නාරමේ මුරුනක් කුල මෙහි තේක්ක වාඩි ප්‍රදේශයේ ප්‍රජා ශාලාව.

මේ තෙක්කවාඩි ප්‍රදේශයේ අලුතින් ගොඩනගන ලද ප්‍රජා ශාලාව ප්‍රදේශයේ ආරක්‍ෂක තත්වය නරක අතට හැරීමෙන් පසු යුද හමුදා භට පිරිස් සමග රාත්‍රී කාලයේදී ගැටුම් ඇතිවීම වැලැක්වීම පිණිස ප්‍රයෝජනයට ගන්නා ලදී. මැන්රිකැප් ආයතනයේ සහයෝගය ඇතිව මේ ප්‍රදේශයේ ජනතාව විසින්ම මේ ශාලාව සාදා නිම

කරන ලදී. මේ ප්‍රදේශවට ඇති එකම පොදු ගොඩනැගිල්ල මෙය වන අතර විශේෂයෙන්ම මෙහි ජයිකා ආයතනයේ ලාංජනය ප්‍රදර්ශනය වන නිසා මෙය පිටරට ආධාර වලින් නිර්මාණය වූවක් නිසා ප්‍රදේශ වාසීන්ට මෙයින් ආරක්ෂාවක් ද ලැබේ. මේ ප්‍රජා ශාලාව සාදා නිම කිරීමේ කාර්‍යයන් ලැබුණු ලාභ මුදල් වලින් ප්‍රදේශයේ ජනතාවට ණය පහසුකම් සැපයීමද ආරම්භ කොට ඇත. මෙහි පවුල් 23 ක් ආදායම් උපයන ව්‍යාපෘති සඳහා ණය පහසු කම් ලබා ගෙන ඇත.



## 4 : පලි ආරු ප්‍රදේශයේ පැදුරු විවීම ගැන පුහුණුව



මේ ප්‍රදේශයේ පාරම්පාරික ගෘහ කර්මාන්තයක් වශයෙන් පැවති පැදුරු විවීමේ කර්මාන්තය නැවත ආරම්භ කිරීමට ගමේ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය මූලිකව කටයුතු කරන ලදී. පසු ගිය වර්ෂයේදී මැන්රිකැෆ් ආයතනයේ සහයෝගය ඇතිව ගමේ පැවැති පැදුරු විවීමේ මධ්‍යස්ථානයේ අලුත් වැඩියා කිරීමට කටයුතු කලත් එයට අවශය මුල්‍ය පහසුකම් නොමැති වීමෙන් අතර මග නතර කර දැමීමට සිදුවිය. 2006 වසරේ අගොස්තු මාසයේදී අලුත් වැඩියා කරන ලද පැදුරු විවීමේ මධ්‍යස්ථානයෙහි අලුතෙන් පැදුරු විවීමේ පුහුණු පාඨමාලාවක් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ආරම්භ කරන ලදී. මෙය අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සහයෝගතාවය ඇතිව දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පවත්වා ගෙන යනු ලැබේ. මාස තුනක පුහුණු පාඨමාලාවට 16 දෙනෙකු සම්බන්ධවී ඇත.

## 5 : නර්ඩ් ආයතනයේ පුහුණු පාඨමාලාව



2006 වසරේ අගෝස්තු මාසයේදී මැන්රිකැෆ් පාඨමාලාව ආයතනය ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (නර්ඩ් ආයතනයේ) සහභාගීත්වය ඇතිව හඳුන්වා දුන් අඩු වියදමින් කල හැකි ගොඩනැගිලි තාක්ෂණ ක්‍රමය ( අච්චු සාදා නිපදවන කොන්ක්‍රීට් භාණ්ඩ ) මෙය මන්නාරම් මහ දිසාපති තුමාගේ අතිශය ප්‍රසාදයට පත්වුනා, මෙය විශේෂයෙන්ම දුප්පත් ජනතාව සඳහා සහභාගීතව ගොඩනැගිලි ඉදිකිරීමේ ක්‍රම පිලිවෙලක් වශයෙන් දිසාපති තුමා විශේෂ අවධාරණයක් යොමු කලා. ඒ නිසාම ඔහු මන්නාරම් දිස්ත්‍රික්කයේ නිවාස සහ ගොඩනැගිලි තැනීමේ අංශ වලට සම්බන්ධිත රජයේ සේවකයිනට මේ ගැන අවබෝධයක් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියා. දිසාපති තුමාගේ ඉල්ලීම අනුව මැන්රිකැෆ් ආයතකනය දින දෙකක පුහුණු වැඩ මුලුවක් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන වල තාක්ෂණ නිලධාරීන් දහඅට දෙනෙකු සඳහා පවත්වනලදී.

මේ වැඩමුලුව ද බොහෝ දෙනාගේ විශේෂ ප්‍රසාදයට ලක්වූ අතර මහ දිසාපති තුමාගේ මූලිකත්වය යටතේ මන්නාරමේ (අච්චු සාදා නිපදවන කොන්ක්‍රීට් භාණ්ඩ) සඳහා වැඩබිමක් සකස් කිරීමට කටයුතු සූදානම් වෙමින් පවතී.